# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2259/52 - 2021 දෙසැම්බර් මස 24 වැනි සිකුරාදා - 2021.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කළුතර නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

මියයාම හේතුකොට ගෙන කළුතර නගර සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ(1)(අ) වගන්තිය යටතේ කළුතර නගර සභාවේ අංක 11 කටුකුරුන්ද - කලපුව කොට්ඨාසයට තේරී පත්වූ පතිරණ ආරච්චිගේ වසන්ත සිල්වා අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කළුතර නගර සභාවේ අංක 11 කටුකුරුන්ද - කලපුව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ගුලවිටගේ රංගන සුමිත් කුමාර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කළුතර නගර සභාවේ තේරීම්භාර නිලධාරි, වන්නකුවත්ත වඩුගේ කාලින්ද ජයවීර ප්‍රනාන්දු වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ගුලවිටගේ රංගන සුමිත් කුමාර, කළුතර නගර සභාවේ අංක 11 කටුකුරුන්ද - කලපුව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

කාලින්ද ජයවීර ප්‍රනාන්දු,
තේරීම්භාර නිලධාරි,
කළුතර නගර සභාව.

2021 දෙසැම්බර් මස 24 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කළුතර.

EOG 12 - 0273

1A - G 35659 — 20 (2021/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*